# වාරිමාර්ග අමාත්‍යාංශය

# පුරප්පාඩු

## මහවැලි ජල සුරක්ෂිතතා ආයෝජන වැඩසටහන (MWSIP)

## අරමුදල් මූලාශ්‍රය : ආසියානු සංවර්ධන බැංකුව (ADB)

මහවැලි ජල සුරක්ෂිතතා ආයෝජන වැඩසටහන වනාහි 2024 වසර වන විට සම්පූර්ණ කිරීමට නියමිතව තිබෙන ශ්‍රී ලංකා රජය හා ආසියානු සංවර්ධන බැංකුවේ හි සහනදායී ණය පහසුකම් යටතේ වාරිමාර්ග අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කරනු ලබන මහවැලි බහුකාර්ය සංවර්ධන වැඩසටහන හි මනා සැලැස්මේ (Master Plan) කොටසකි.

**අයදුම්පත් :**

පහත සඳහන් තනතුර සඳහා කොන්ත්‍රාත් පදනම මත යථා යෝග්‍ය පරිදි සුදුසුකම් ලත් ශ්‍රී ලාංකීය පුරවැසියන් වෙතින් අයදුම්පත් කැඳවනු ලබන අතර, අයදුම්කරුවන් විසින් ස්වකීය අයදුම්පත් කොළඹ 10, T. B. ජයා මාවතේ අංක 493-1/1 හි මහවැලි ජල සුරක්ෂිතතා ආයෝජන වැඩසටහනෙහි වැඩ සටහන් අධ්‍යක්ෂ වෙත 2022.09.19 වන දිනට හෝ ඊට පෙර ලැබෙන සේ සිය ජීව දත්ත තොරතුරු ප්‍රකාශ සමග ඥාතීන් නොවන නිර්දේශකයින් දෙදෙනෙකුගේ නම් හා විමසුම් තොරතුරු විස්තර සහ සිය මූලික සුදුසුකම් වන අධ්‍යාපන, වෘත්තීයවේදී සුදුසුකම් හා පළපුරුද්ද පිළිබඳ සහතික වල පිටපත්ද සමගින් එකී ලිපිනයට එම දිනයට හෝ ඊට පෙර ලැබෙන සේ ලේඛනගත තැපැලෙන් එවිය යුතුය.

කරුණාකර අයදුම් කරනු ලබන තනතුර ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ සටහන් කරනු මැනවි. එයට අමතරව විද්‍යුත් ලිපිනයේ (ඊමේල්) හි විෂය රේඛාවේ අයදුම්කරනු ලබන තනතුර සටහන් කර hr.mwsip@gmail.com යන ලිපිනයට පිටපත් කර එම අයදුම්පතේ ඍජු ඉදිරි පිටපතක් pdadbproject@gmail.com යන විද්‍යුත් ලිපිනයට ඉදිරිපත් කරන ලෙස අයදුම්කරුවන් ගෙන් ඉල්ලා සිටිනු ලැබේ.

| තනතුර හා රැකියා පැතිකඩ | සුදුසුකම් හා පළපුරුද්ද |
|---|---|
| **01. ඉඩම් අත්පත්කර ගැනීමේ හා නැවත පදිංචි කිරීමේ විශේෂඥ (PS-3)**<br><br>උතුරු මැද පළාත් ඇළමාර්ග ව්‍යාපෘතිය - මඩාටුගම තනතුරු 01<br><br>**රැකියා පැතිකඩ :**<br><br>● කිසිදු බාධකිරීම් වලින් තොරව ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු සිදුවන බැව් තහවුරු කර ගැනීමට ශ්‍රී ලංකා රජයේ හා ආසියානු සංවර්ධන බැංකුවේ (ADB) හි මාර්ගෝපදේශ පරිදි නැවත පදිංචි කිරීම් හා සමාජ ආරක්ෂන පද්ධති ක්‍රියාවට නැංවීම හා ව්‍යාපෘතියේ ඉඩම් අත්පත් කර ගැනීම් ඉලක්ක සක්ෂාත් කර ගැනීම .<br><br>● ඵලදායි / බලපවත්වන දුක් ගැනවිලි වලට සහන සලසන යාන්ත්‍රනයක් ස්ථාපන කිරීම හා වෙනත් අදාළ කටයුතු සහ අත්පත් කර ගැනීම් සඳහා කාල විශේෂිත / නිශ්චිත අවසාන දිනයක් සපුරා ගැනීම.<br><br>● ADB සහ ජාතික අනිවාර්ය අනිච්ඡානුගත නැවත පදිංචි කිරීම් ප්‍රතිපත්තියක් සපුරා ගැනීම සඳහා බලපවත්වනු ලබන පාර්ශවයන්ට අත්වන ප්‍රතිලාභ සඳහා ප්‍රතිපත්ති ලේඛන පිළියෙල කිරීම.<br><br>● ඉඩම් අත්පත්කර ගැනීම්වලට අදාළ කරුණු කාරණා ගැටළු හේතු බව යම් ප්‍රමාදයන් සිදු වීම් වළක්වා ගනිමින් නියමිත කාල රාමුවක් ඇතුළත ව්‍යාපෘති ඉලක්ක සාක්ෂාත් කර ගැනීම තහවුරු කර ගැනීම සඳහා ඉඩම් අත්පත්කර ගැනීම සහ නැවත පදිංචි කිරීම හා ආරක්ෂණ පද්ධති වලට පරිසර පදිංචිවලට සම්බන්ධ ඵලදායි ජාලයක් නිර්මාණය කර පවත්වාගෙන යාම.<br><br>● සමාජ ආරක්ෂණ හා ඉඩම් අත්පත්කර ගැනීමේ කටයුතුවලට අදාළ වාර්තා පිළියෙල කිරීම. | පහත සඳහන් සුදුසුකම්, පළපුරුද්ද වැටුප් මට්ටම්, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක 01/2019 දරන චක්‍රලේඛයට අනුකූලය.<br><br>01. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනුලබන අදාළ ක්ෂේත්‍රයේ ප්‍රථම උපාධියක් සාර්ථකව සම්පූර්ණ කර තිබීම<br><br>**හෝ**<br><br>අදාළ ක්ෂේත්‍රයේ උපාධියට සමාන සුදුසුකමක් ලෙස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන සුදුසුකමක්<br><br>**හෝ**<br><br>අදාළ ක්ෂේත්‍රයේ පිළිගත් ආයතනයකින් ලබාගත් ආශ්‍රිත සාමාජිකත්වය / සමාන වෘත්තීයවේදී සුදුසුකමක්<br><br>**සමග**<br><br>කළමනාකරණ මට්ටමේ අවම වශයෙන් වසර 14 ක පශ්චාත් යෝග්‍යතා පළපුරුද්ද.<br><br>02. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන අදාළ ක්ෂේත්‍රයේ ප්‍රථම උපාධියක් සාර්ථකව සම්පූර්ණ කර තිබීම<br><br>**හෝ**<br><br>අදාළ ක්ෂේත්‍රයේ උපාධියට සමාන සුදුසුකමක් ලෙස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන සුදුසුකමක්<br><br>**හෝ**<br><br>ආදාළ ක්ෂේත්‍රයේ පිළිගත් ආයතනයකින් ලබාගත් ආශ්‍රිත සාමාජිකත්වය / සමාන වෘත්තීය වේදී සුදුසුකමක්<br><br>**සහ**<br><br>අදාළ ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීයවේදී ආයතනයකින් ලබාගත් සමාන වෘත්තීයවේදී සුදුසුකමක් හෝ ආයතනික / වරලත් සාමාජිකත්වය සහ අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධි සුදුසුකමක් / උපාධියක්<br><br>**සමග**<br><br>අඩුම තරමින් වසර 10 (දහයක) කළමනාකරණ මට්ටමේ පශ්චාත් යෝග්‍යතා පළපුරුද්ද (සුදුසුකම් ලැබීමෙන් පසු ලබාගත්)<br><br>03. රජයේ දීප ව්‍යාප්ත සේවයේ 1 වන පන්තියේ නිලධාරියෙකු වීම හෝ අදාළ ක්ෂේත්‍රයේ සමාන තත්ත්වයක්<br><br>**සමග**<br><br>1 වන පන්තියේ තනතුරක අඩුම තරමින් වසර 05 (පහක) පළපුරුද්ද<br><br>(වැටුප් මට්ටම : PS 3 - රු. 180,000.00 - රු. 195,000.00) |

- MSD චක්‍රලේඛ අංක 01/2019 පරිදි ඉහත වැටුපට අමතරව ජීවන වියදම් දීමනාව ගෙවනු ලැබේ.

**පොදු කොන්දේසි**

01. අයදුම්කරුවන් වයස අවුරුදු 62 ට අඩු විය යුතුය.
02. සියලුම නිලධාරීන් විසින් අදාළ රජයේ ආයතන හා වෙනත් නියෝජිතායතන හා සමග සිය රාජකාරී කටයුතු සම්බන්ධීකරණය කරමින් හා සහයෝගිතාවයෙන් සිදු කරනු ඇතැයි බලාපොරොත්තු වනු ලැබේ.
03. ඉඩම් අත්පත් කරගැනීම් හා නැවත පදිංචි කිරීම් පිළිබඳව ශ්‍රී ලංකාව තුළ විදේශීය අරමුදල් ප්‍රතිපාදිත ව්‍යාපෘති වල ලත් සේවා පළපුරුද්ද.
04. මෙම තනතුරට ඉංග්‍රීසි භාෂාව පිළිබඳව නිපුණතාව / ප්‍රවීණතාව රජයේ රෙගුලාසි සම්බන්ධව හුරුපුරුදු බව සහ පරිගණක සාක්ෂරතාව, අත්‍යවශ්‍ය පූර්වාශ්‍යතා වනු ඇත.
05. රැකියාව සඳහා වන කොන්ත්‍රාත්තුව එක් වසරක් සඳහා වනු ඇති අතර, වැඩවල කාර්ය සාධනය වැඩසටහනේ / ව්‍යාපෘතියේ අවශ්‍යතාවය පරිදි වාර්ෂිකව නැවත දීර්ඝකරගත හැකිය.
06. අංක 01/2019 දරන කළමනානකරණ සේවා චක්‍රලේඛනය හා ඉන්පසු සිදුකර ඇති සංශෝධන පරිදි රජය අනුමත කර ඇති වැටුප හා දීමනා ගෙවනු ලැබේ. (http://www.treasury.gov.lk)
07. සති අන්තයන්හි හා දීර්ඝ කාලයක් තුළ (පැය ගණන්) තුළ සේවය කිරීමට හැකියාව.

සුදුසුකම් හා පළපුරුද්ද මත පදනම්ව කෙටි ලැයිස්තුගත කරනු ලබන අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයකට කැඳවනු ලබන අතර, තෝරා ගැනීම කුසලතාවය මත පදනම්ව සිදු කරනු ලැබේ. එසේ හෙයින් අයථා බලපෑම් කිරීම් හෝ බඳවා ගැනීමේ ක්‍රියාවලිය සඳහා නියෝජනයන් සිදු කිරීම් අයදුම්පත් ප්‍රතික්ෂේප කිරීමට හේතු පාදක වනු ඇත. රජයේ සේවයේ / ව්‍යවස්ථාපිත මණ්ඩල / සමුපකාර / සංස්ථා සහ වෙනත් රජයේ ආයතනවල සේවයේ නියුතු අපේක්ෂකයන් සිය අයදුම්පත් අදාළ ආයතනවල ප්‍රධානින් මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතු වන අතර, ඔවුන් විසින් අපේක්ෂකයා තෝරා ගනු ලැබුවහොත් දැනට දරන තනතුරින් අයදුම්කරු පූර්ණකාලීන පදනම මත මුදහැරිය හැකිද යන වග විදහා දැක්විය යුතුය.

ඉහත අවශ්‍යතා සම්පූර්ණ කරනු නොලබන අසම්පූර්ණ අයදුම්පත් භාර ගැනීම ප්‍රතික්ෂේප කෙරෙනු ලැබේ.

**ලේකම්,**
**වාරිමාර්ග අමාත්‍යාංශය.**